පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
ව්‍යාවහාරික විද්‍යා පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
කුලියාපිටිය

# DIPLOMA IN SOFTWARE ENGINEERING

# (මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව)

# 2019

මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව විෂයානුබද්ධ සවිස්තරාත්මක විෂයමාලාවකින් සමන්විත ඉහත ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාවේ 2019 කණ්ඩායම සඳහා දැන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පාඨමාලාව මෘදුකාංග තාක්ෂණය පිළිබඳ උනන්දුවක් දක්වන සැමට මෘදුකාංග නිර්මාණකරණයෙහිලා ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම වර්ධනය කරගැනීමටත්, එම ක්ෂේත්‍රයේ රැකියා අපේක්ෂිතයින්හට යහපත් රැකියා පරිසරයකට මඟ පෙන්වීමට මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල මෘදුකාංග ඉංජිනේරු විද්‍යා අංශයට අදාළ සේවහි නියුතුවූවන්ට සිය වෘත්තීය සුදුසුකම් වැඩි දියුණු කරගැනීමටත් හැකිවන පරිදි විශේෂයෙන් සකස් කර ඇත.

ඇතුලත්වීමේ සුදුසුකම් :

- එක්වරක දී ඕනෑම විෂයධාරාවකින් අ.පො.ස.(උ.පෙළ) විෂයයන් 02 ක් සමත්වීම (විෂයයන් 04ක් පැවති විට දී විෂයයන් 3 ක්) හෝ,
- ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළුව එක්වරක දී විෂයයන් 6ක් සහිතව අ.පො.ස.(සා.පෙළ) සමත්වීම හෝ,
- එක් වරක දී විෂයයන් 6ක් සහිතව අ.පො.ස.(සා.පෙළ) සමත්ව පරිඝණක ක්ෂේත්‍රයේ වසරකට වැඩි සේවා පළපුරුද්ද හෝ,
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභාව සහ පාඨමාලා අධ්‍යයන මණ්ඩලය අනුමත කරන මීට සමාන සුදුසුකමක්

| | |
|---|---|
| **පාඨමාලා කාලය** | : එක් අවුරුදු (ඉරිදා) |
| **මාධ්‍යය** | : ඉංග්‍රීසි |
| **පාඨමාලා ගාස්තුව** | : රු.40,000/- |
| **පාඨමාලා පවත්වන ස්ථානය** | : ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රය |

අයදුම්පත් හා අදාළ විස්තර :

1. අයදුම්පත් හා වැඩි විස්තර සතියේ දිනවල පෙ.ව 09.00ත් ප.ව 03.00ත් අතර විශ්වවිද්‍යාලයේ පිළිගැනීමේ නිලධාරී අංශයට පැමිණ රු.600/- ක මුදලක් ගෙවීමෙන් හෝ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය http://www.wyb.ac.lk/dsad වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකිය.
2. වෙබ් අඩවියට පිවිස ලබා ගත් අයදුම්පත් සමඟ ඕනෑම මහජන බැංකු ශාඛාවක ගිණුම් අංක **028100151586123** දරණ ගිණුමට රු.600/-ක මුදලක් බැරකර එම රිසිට් පත අමුණා එවිය යුතුය. (රිසිට්පත අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

සම්පූර්ණ කරන ලද අයදුම්පත් රු. 35/- ක මුද්දර සහිත තම ලිපිනය සඳහන් 23 cm x 10 cm ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග ***පාඨමාලා අධ්‍යක්ෂ, මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව, පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය, ව්‍යවහාරිකවිද්‍යා පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය , කුලියාපිටිය*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2018.11. 01 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. වැඩි විස්තර 037-2282759 ඇමතීමෙන් ලබාගත හැකිය.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,
කුලියාපිටිය.
2018.09.18